# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE


| මගේ අංකය / எனதுஇல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HQ/04/EER./P.M.V(E)./2019 | ........................................ | 2018.06.20 |

**සමෘද්ධි චක්‍රලේඛ අංක 2019/07**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

ආර්ථික සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන
**සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මානවැඩසටහන- 2019**

2018 වර්ෂයේ සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදි ඔබ ඇතුළු සියළු සමෘද්ධි නිලධාරින් දක්වන ලද දායකත්වය ඉතා අගය කොට සලකන අතර ලබා ගත් එම අත්දැකීම් ද පාදක කරගනිමින් 2019 වසර තුල **අපනයන අභිමුඛ හා ආනයන ආදේශන** ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරිම කෙරෙහි අවධානය යොමුව ඇති බව පළමුව ඔබ වෙත පෙන්වා දෙමි.

වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබල ගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරිමේ පුරෝගාමී ආයතනයක් බවට පත්විම දෙපාර්තමේන්තුවේ දැක්ම වන හෙයින් දිළිදුකම පිටුදැකීම උදෙසා වූ රාජ්‍ය ප්‍රතිපත්තියට සමගාමීව,ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ප්‍රාථමික කර්මාන්ත අංශයත්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය හා ඒකාබද්ධව නිෂ්පාදන ගම්මාන තුලින් සමෘද්ධී ප්‍රතිලාභින් / අඩුආදායම්ලාභින් ද සමඟින් රට සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින් ඒ අනුව **"සමෘද්ධිනිෂ්පාදන ආදර්ශ ගම්මාන"** වැඩසටහනමෙවර ක්‍රියාත්මක වනු ඇත.

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩුආදායම්ලාභින් ඇතුළුව සමස්ත ගම්මානයම සවිබලගැන්වීමම ඉලක්ක ගත කොටපහත සඳහන් අරමුණු ඉටු කර ගැනිමට හැකිවන පරිදි 2019 වර්ෂයේදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බව විශේෂයෙන් පෙන්වා දෙමි.

- අපනයන අභිමුඛ හෝ ආනයන ආදේශනකෘෂි, සත්ත්ව පාලන, ධීවර, කර්මාන්තය යන කුමන හෝ නිෂ්පාදන කටයුත්තක් වර්ධනය කල හැකි විය යුතුය.
- භාණ්ඩ හෝ සේවාවක නිෂ්පාදන කටයුතු සැකස්මේ සිට අගය එකතු කිරිම හා විකිණිම යන අගයදාම එකතු කළ නිෂ්පාදනයන් සඳහා විශේෂ අවධානය යොමු කල යුතුය.


**1වනඅදියර,4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල./1ம் கட்டம், 4வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1stStep, 4 th floor, SethsiripayaBattaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ(මානව සම්පත්) / பணிப்பாளர் (மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

- නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාල වූ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- වගා නොකල ඉඩම්, අපනයන අභිමුඛ/ ආනයන ආදේශන කෘෂි භෝග වගාවන් සඳහා යොදා ගැනිම.
- නිශ්චිතව සවිබල ගැන්විය හැකි සමෘද්ධිලාභි පවුල් හඳුනා ගැනිම හා ගම්මානයේ සියළු සමෘද්ධිලාභි පවුල් අදාල නිෂ්පාදන කටයුතු සඳහා දායක කර ගැනිම.
- විශේෂයෙන් දැකුම්කළු තුරුලතා බහුල පරිසර හිතකාමි ගමක් නිර්මාණය කිරිම.

## 03. ගම්මාන හඳුනා ගැනිම

i. අපනයන විභවයක් සහිත හෝ ආනයන ආදේශකයක් ලෙස සැලකිය හැකි දැනට බහු වාර්ෂික භෝග වගා කර ඇති හෝ වගා කිරිමට යෝග්‍ය ගම්මාන විය යුතුය.

ii. එක් දිස්ත්‍රික්කයකින් එක් ගම්මානයක් තෝරා ගත යුතුය.

iii. ගම්මාන තෝරා ගැනිමේදි ව්‍යාපෘති 50,000 හා අපනයන නිෂ්පාදන ගම්මාන සම්බන්ධයෙන් ඔබ දිස්ත්‍රික්කයේ පවත්වන ලද දැණුම්වත් කිරිමේ රැස්විමේදි පෙන්වා දුන් තොරතුරු අදාල කර ගත යුතුවේ.

iv. නිෂ්පාදනයේ යෙදෙන පිරිසෙන්50% ක් සමෘද්ධිලාභි / අඩුආදායම්ලාභිපවුල් විය යුතුය.

v. නිෂ්පාදන හෝ සේවාව බහුතරය සමජාති විය යුතුය.

vi. නිෂ්පාදනයේ යෙදෙන පිරිස තම ජීවන මාර්ගය වැඩිදියුණු කර ගැනිමට උනන්දුවක් දක්වන අය වීම අත්‍යාවශ්‍ය වනු ඇත.

*vii.* තවදමෙලෙස තෝරාගනු ලබන ගම්මානයන්ට අදාල සම නිෂ්පාදන සිදු කරන අවට ගම්මාන වේ නම් එම ගම්මාන ද ඇතුලත්ව සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ පොකුරු ගම්මානයන් ලෙස සංවර්ධනය කිරිමේ හැකියාව පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

*viii.* දැනටමත් *DSD/HO/04/ER/07/*අප.ගම්.-2019 හා 2019.05.22 දිනැති ලිපියට අනුව ඔබ විසින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට එකක් වන සේ එවා ඇති ගම්මානයන් ගෙන් එක් ගම්මානයක් යෝජනා කරන්නේ නම් ඒ පිළිබඳව අප වෙත දන්වා එවීම අවශ්‍ය වනු ඇත.

## 04. නිෂ්පාදන සංවර්ධන සැලැස්ම සකස් කිරිම

i. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් තම ගම්මානය සතු මානව, ස්වභාවික සම්පත් පිළිබඳව, පුහුණු අවශ්‍යතා හා අපනයන ගම්මානයක් සඳහා වූ අවශ්‍යතාවයන් හඳුනා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

ii. අනතුරුව සංවර්ධන නිලධාරි විසින් බැංකු කළමණාකරු, ව්‍යාපෘති කළමණාකරු හා මුලස්ථාන කළමණාකරුද සමඟින් එක්ව අපනයන ගම්මානය වෙනුවෙන් ක්‍රියාත්මක සැලැස්මද සහිතව ඇමුණුම 01 ට අනුව ව්‍යාපෘති වාර්තාවක් සකස් කල යුතුවේ.

iii. එම ව්‍යාපෘති වාර්තාව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් දිස්ත්‍රික් ලේකම්ගේ / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය සමඟින් 2019.07.10 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කල යුතු වේ.

## 05. පුහුණුව හා තාක්ෂණික දැණුම ලබාදීම

අදාල ගම්මාන සඳහා පුහුණුව හා තාක්ෂණික දැණුම අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා වන ඉල්ලීම ක්‍රියාත්මක සැලැස්ම සමඟ ඉදිරිපත් කලයුතුවේ.

## 06. ප්‍රතිපාදන වෙන් කිරිම

1. තෝරා ගනු ලබන එක්නව ගම්මානයක් සඳහා දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 02ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අනුමත කරනු ලැබේ.
2. වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමාව යටතේ එක් ප්‍රතිලාභී ව්‍යාපෘතියක් වෙනුවෙන් උපරිම දෙපාර්තමේන්තු දායකත්වය රු. 45,000 /- ක් වේ.
3. උපරිම දෙපාර්තමේන්තු දායකත්වය 60 % ක් වන අතර අවම ප්‍රතිලාභී දායකත්වය 40% ක් විය යුතු වේ. ප්‍රතිලාභී දායකත්වය ශ්‍රමය, අමුද්‍රව්‍ය හෝ වෙනත් දායකත්වයක් විය හැකිය.
4. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය,අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් එම ගම්මානය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය, හා පුහුණු අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ඇත.
5. කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය හරහා අදාල ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය උපකරණ, යන්ත්‍රසූත්‍ර හෝ යටිතල පහසුකම් සම්පූර්ණ කර ගැනිමේ හැකියාව පවති.

## 07. අධීක්ෂණය, මෙහෙයවීම හා ඇගයිම

1. නිෂ්පාදන සංවර්ධන සැලැස්ම සකස් කරන ලද නිලධාරින්මසකට වරක් රුස්වී, නිෂ්පාදන සැලැස්ම නියමිත අරමුණු කරා යන්නේද පිළිබඳව සාකච්ඡා කිරිම, ඊට අවශ්‍ය පියවර ගැනිම හා යාවත්කාලීන කිරිම කළයුතුවේ.
2. මුලස්ථාන කළමණාකරු, අදාල සමෘද්ධි බැංකු කළමණාකරු, ව්යාපෘති කළමණාකරු සමඟින් සමෘද්ධි සංවර්ධන නිලධාරිගේ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරිගේ නිරන්තර අධික්ෂණය යටතේ සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය.
3. මෙහිදීප්‍රජාමූලසංවිධානදව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කළ යුතු වේ.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මාසික දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රුස්වීමේදි සියළු නිලධාරින්ට ආදර්ශයක් ලබා ගැනිම සඳහා මෙම වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය කිරිම වඩාත් වැදගත් වනු ඇත.
5. ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටක ප්‍රධාන කාර්යාලයහා ප්‍රාථමික කර්මාන්ත අංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරිමටත් යාවත්කාලින කිරිමටත් කටයුතු කළ යුතුවේ.

6. දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ /දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි විසින් තම දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මානයන් කෙරෙහි සමස්ථ අධීක්ෂණය සිදු කළ යුතු අතර **'සමෘද්ධි ප්‍රතිලාභීන් ඇතුළු අඩුආදායම්ලාභීන් සවිබල ගැන්වීම '** සඳහා නිරන්තර අවධානයක් යොමු කිරීම මින් අවධාරණය කරමි.

## 8. පරිපාලන වියදම්

- මෙමවැඩසටහන යටතේ දරනු ලබන රජයේ වියදමෙන් 2.0 % ක් පරිපාලන වියදම් ලෙස දැරීමට හැකියාව ඇති අතර ඉන් 0.5% ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ද, ඉතිරි 1.5 % ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ද බෙදී යන පරිදි විය යුතුය.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය මුදල් රෙගුලාසි, මෙම චක්‍රලේඛ උපදෙස් හා අදාල වෙනත් චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් ක්‍රියාත්මක කළ යුතු අතර සම්මත මිලගණන්ද සැලකිල්ලට ගෙන අදාල රේඛීය ආයතන වල නිර්දේශයන්ද ලබා ගෙන ගෙවීම් කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙමචක්‍රලේඛය පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍යවුවහොත් දුරකතන අංක 011-2873801 මගින් හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය ඇමතිය හැකිය. මීට අමතරව ප්‍රාථමික කර්මාන්ත අංශයේ දුරකතන අංක 011-2877845 හරහාද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දුරකතන අංක 0112-867275 හරහාද, කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතියේදුරකතන අංක 011-2425720 මගින් ද ව්‍යාපෘති පිළිබඳව තොරතුරු විමසිය හැකි බව කාරුණිකව දන්වමි.

සමෘද්ධි නිෂ්පාදන සපිරි ආදර්ශ ගම්මානයක් නිර්මාණය කිරිමෙහි ලා ඔබ ඇතුළු නිලධාරින් දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

| | |
|---|---|
| 1. ලේකම්, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය | - කා.දැ.ගැ.ස. |
| 2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | -කා.දැ.ගැ.ස.හා අ.ක.ස |
| 3.ප්‍රාදේශීය ලේකම් .................. | -කා.දැ.ගැ.ස හා අ.ක.ස |
| 4. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස. |
| 5. අධ්‍යක්ෂ. ප්‍රාථමික කර්මාන්ත අංශය | - කා.දැ.ගැ.ස.හා අ.ක.ස |
| 6. අධ්‍යක්ෂ, කෘෂිකර්ම නවිකරණ ව්‍යාපෘතිය | -කා.දැ.ගැ.ස.හා අ.ක.ස |
| 7. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස. |
| 8. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස. |
| 9. සියළුම අංශ ප්‍රධානීන් ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කා.දැ.ගැ.ස. |
| 10.සමෘද්ධි මූලස්ථාන කළමණාකරු ......................... | |

අ.ක.ස හා අදාල මහාසංගම් කළමණාකාර අධ්‍යක්ෂ/ සමෘද්ධි ව්‍යාපෘති /ප්‍රජා මූල බැංකු කළමණාකරු සහ සමෘද්ධි සංවර්ධන නිලධාරී දැනුවත් කිරීම සඳහා